# අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
# General Certificate of Education (Adv. Level) Examination, 2020

## ව්‍යාපාර අධ්‍යයනය II
## Business Studies II (නව නිර්දේශය)

1. වෘත්තීය පුහුණු පාඨමාලාවක් අවසන් කිරීමෙන් පසු ආශා විසින් 'අමාශා' නමින් රූපලාවණ්‍යාගාරයක් ආරම්භ කර, එහි කළමනාකරු ලෙස අමර පත් කරන ලදි. රු. 500 000 ක ණය මුදලක් සහ ඇයගේ ඉතුරුම් මුදල් රු. 200 000 ක් ද මෙම ව්‍යාපාරය සඳහා ආශා විසින් ආයෝජනය කරනු ලැබී ය. ආශා විසින් රු. 600 000 ක් ගෙවා ගොඩනැගිල්ලක් මිල දී ගත් අතර, ඉතිරිය තම ව්‍යාපාරය මගින් ඉහළ ගුණත්වයෙන් යුතු සේවාවක් සැපයීම සඳහා අවශ්‍ය නවීන උපකරණ ආනයනය කිරීම සඳහා වැය කරන ලදි. ඇය ඇතුළු පුහුණු කාර්ය මණ්ඩලය තම ගනුදෙනුකරුවන්ගේ පහසුව සලකා ඕනෑම මොහොතක දී, ගනුදෙනුකරුවන්ගේ නිවසට පැමිණ හෝ රූපලාවණ්‍යාගාරයේ දී හෝ තම සේවා සැපයීමට කටයුතු කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපාරය පහත නිර්ණායක අනුව වර්ග කරන්න.
   (අ) හිමිකාරිත්වය : ..................................................
   (ආ) අරමුණ : ..................................................
   (ඉ) පරිමාණය : ..................................................
   (ඊ) නිෂ්පාදන අංශය : .................................................. (ලකුණු 04 යි)

(ii) (අ) ආශාගේ ව්‍යාපාරය ඉටු කරනු ලබන්නේ පුද්ගල අවශ්‍යතාවක් ද නැතහොත් වුවමනාවක් ද යන්න කෙටියෙන් විස්තර කරන්න.
   (ආ) ආශා විසින් මිල හැර, පාරිභෝගික ඉල්ලුම වැඩි කර ගැනීම සඳහා යොදා ගෙන ඇති වෙනත් උපක්‍රම දෙකක් නම්කර, ඒවා විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) මෙම ව්‍යාපාරයේ ශක්තීන් දෙකක් හා දුර්වලතා දෙකක් දක්වන්න.
   (ආ) ආශාගේ ව්‍යාපාරය අයත් කර්මාන්තය ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර දෙකක් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) මෙවැනි ව්‍යාපාරවල දැකිය හැකි සීමා හතරක් සඳහන් කරන්න.
   (ආ) ආශාගේ ව්‍යාපාරයේ ව්‍යවසායකත්වයට අමතරව යොදවා ඇති සම්පත් හතරක් උදාහරණ සහිතව ලියන්න. (ලකුණු 04 යි)

(v) ආශාගේ ව්‍යවසායකත්ව ගතිලක්ෂණ සහ කුසලතා තවදුරටත් වර්ධනය කරගත හැකි ආකාර හතරක් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

2. (i) (අ) වෙළෙඳ විෂමාචාර පිළිබඳව ඔබට පැමිණිලි කළ හැකි ශ්‍රී ලංකාවේ ස්ථාපිත ආයතන හතරක් නම් කරන්න.
   (ආ) වෙළෙඳුන් විසින් සිදු කරනු ලබන වෙළෙඳ විෂමාචාර දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) 'විධිමත් සංවිධානයක්' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි විස්තර කරන්න.
   (ආ) සීමිත පොදු සමාගම්වල ලක්ෂණ හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) 'වරලත් ව්‍යාපාර' යන්න නිර්වචනය කරන්න.
   (ආ) ලැයිස්තුගත පොදු සමාගමක් ලැයිස්තුගත නොකළ පොදු සමාගමකින් වෙනස් වන්නේ කෙසේ දැයි විස්තර කරන්න. (ලකුණු 04 යි)

[ දෙවෙනි පිටුව බලන්න

(iv) කීර්ති, දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන මසුන් අපනයනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යනු ලැබේ. කොවිඩ් -19 වසංගතය හේතුවෙන් මසුන් කිලෝවක අපනයන මිල ඇ.ඩො. 16 සිට ඇ.ඩො. 06 දක්වා අඩු විය. මේ නිසා කීර්ති මහතා තම ව්‍යාපාරය වසා දැමීමට තීරණය කළ නමුත් සේවකයින් සහ ප්‍රදේශවාසීන් විසින් එම තීරණය කෙරෙහි විරෝධයක් දක්විය.

(අ) මෙම ව්‍යාපාරයේ 'සමාජ වගකීම' යනුවෙන් අදහස් කරනුයේ කුමක් ද ?

(ආ) ඉහත ව්‍යාපාරය කෙරෙහි උනන්දුවන පාර්ශ්ව තුනක් නම් කර, එක් එක් පාර්ශ්වය එසේ උනන්දු වීමට බලපානු ලබන එක් හේතුව බැගින් දක්වන්න. (ලකුණු 04 යි)

(v) තාර්කික පාරිභෝගිකයෙකු වෙළෙඳ පොළ තුළ හැසිරෙන ආකාරය කරුණු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

3. රජය මගින් පවත්වාගෙන යනු ලබන ගුවන් සමාගමක් තම වෙළඳ පොළ කොටස වර්ධනය කර ගැනීමේ අපේක්ෂාවෙන් පෞද්ගලික ගුවන් සමාගමක් වන 'එයාර් ඇල්ෆා' සමග සංයෝජනය වන ලදී.

(i) (අ) 'ව්‍යාපාර ඒකාබද්ධවීම' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?

(ආ) ඉහත සමාගම් දෙක අතර සිදු වූ ඒකාබද්ධවීම කුමන සංයෝජනයට අදාළ දැයි නම් කර, එම සංයෝජන වර්ගය පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) කල්බදු සමාගම් මගින් ව්‍යාපාරිකයකුට හිමිවන වාසි හතරක් ලියන්න.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජ්‍යායතන කාර්යයන් හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී මුදල් සමාගම් අතර ඇති වෙනස්කම් දෙකක් විස්තර කරන්න.

(ආ) 'ලංකාසෙට්ල්' (Lanka Settle) පද්ධතියේ ප්‍රධාන ගෙවීම් පියවීම් පද්ධති දෙක පිළිබඳව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ගුවන් ප්‍රවාහනය, ආර්ථිකයට වැදගත් වන ආකාරය පිළිබඳව හේතු දෙකක් දක්වමින් විස්තර කරන්න.

(ආ) ශ්‍රී ලංකාවේ මහාමාර්ග ප්‍රවාහන අංශයේ දැකිය හැකි වර්තමාන ප්‍රවණතා දෙකක් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 04 යි)

(v) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නිර්වචනය කිරීමේ දී 'ප්‍රමාණාත්මක සාධක' යනුවෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කර, ඒ සඳහා උදාහරණ දෙකක් සපයන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

4. (i) (අ) 'ණයවර ලිපිය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?

(ආ) දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ (SAARC) සහයෝගිතා කටයුතු ක්ෂේත්‍ර හතරක් නම් කරන්න. (ලකුණු 04 යි)

(ii) (අ) සේවක අර්ථසාධක අරමුදල (EPF) සඳහා දායකත්වය ලබා දිය යුතු පාර්ශ්ව නම් කර, ඔවුන් දැරිය යුතු අවම දායකත්ව ප්‍රතිශත සඳහන් කරන්න.

(ආ) රක්ෂණය කළ නොහැකි අවදානම් හඳුනාගත හැකි ආකාර හතරක් දක්වන්න. (ලකුණු 04 යි)

(iii) (අ) චෙක්පතක් ලිවීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු හතරක් සඳහන් කරන්න.

(ආ) සීමාකාරී පිටසනක ඇති වැදගත්කම හේතු දෙකක් ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) 'පොදු (General) වගකීම් රක්ෂණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද ?

(ආ) ව්‍යාපාර කටයුතු සඳහා සන්නිවේදනයේ වැදගත්කම හේතු තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) ව්‍යාපාරයකට 'තීරු සංකේත' (Barcodes) වැදගත් වන්නේ ඇයි දැයි හේතු හතරක් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

****